" විශිෂ්ට රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "

**ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත**

**பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்**

**OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE**

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary — දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599; ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601; ඊ මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk

සාමාන්‍ය දුරකථන / பொது தொலைபேசி / General Telephone - 011 - 2093000

SLSI ISO 9001 · SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

| මගේ අංකය / எனது இலக்கம் / My No. | CSWP/PTR/9-7/FI/8 | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | | දිනය / திகதி / Date | 2023.08. 02 |
|---|---|---|---|---|---|

ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය.

ප්‍රධාන ලේකම්,
වයඹ/උතුරු මැද/උතුර/නැගෙනහිර/සබරගමුව/ඌව/මධ්‍යම/දකුණු, පළාත

ලේකම්,
පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය,
බස්නාහිර පළාත.

**<u>බස්නාහිර පළාත් අධ්‍යාපන ,සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යාංශය යටතේ, බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවතින අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ (අධ්‍යාපන පරිපාලන) තනතුර සඳහා ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවීම.</u>**

බස්නාහිර පළාත් අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යාංශය යටතේ, බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවතින, **අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ (අධ්‍යාපන පරිපාලන) තනතුර සඳහා සුදුසුකම් සහිත ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

| අනු අංකය | තනතුර | අනුමත ශ්‍රේණිය |
|---|---|---|
| 01 | අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ (අධ්‍යාපන පරිපාලන) | I ශ්‍රේණිය |

02. **<u>I ශ්‍රේණියේ තනතුර සඳහා සුදුසුකම් -</u>**

- ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරියෙකුවීම.
- අයදුම්කරු මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වන **2023.08.18** දිනට පූර්වාසන්න වසර 05 තුලදී කිසිදු විනයානුකූල දඬුවමකට යටත් නොවූ අයෙකු විය යුතු අතර, එම වසර 05 තුලදී සියලුම වැටුප් වර්ධක උපයාගෙන තිබිය යුතු ය.
- සෑම අයදුම්කරුවෙකුම තම තනතුරේ සේවය කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

03. <u>තෝරාගනු ලබන ක්‍රමවේදය -</u>

ඉහත 02 ඡේදයේ සඳහන් සුදුසුකම් සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන්, බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම්ගේ ප්‍රධානත්වයෙන් යුතු සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය මත පදනම්ව ලකුණු ලබා දෙන අතර, එම ලකුණු මත පදනම්ව ඉහළම ලකුණු ලබා ගත් නිලධාරියා අදාළ තනතුරට තෝරා ගැනීමට කටයුතු කරනු ලැබේ. (අයදුම්පත්‍රය හා ලකුණු ලබාදීමේ ක්‍රමවේදය මේ සමඟ අමුණා ඇත.)

04. නිලධාරීන් විසින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් තම ආයතන ප්‍රධානියා, දෙපාර්තමේන්තු ප්‍රධානියා හා අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය සහිතව ඉදිරිපත් කල යුතු වේ.

05. ඒ අනුව, මේ සම්බන්ධයෙන් ඔබ අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ කලාප අධ්‍යාපන කාර්යාලයේ හා ඒ යටතේ වන ආයතනයන්හී සේවය කරනු ලබන ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ සුදුසුකම්ලත් නිලධාරීන් දැනුවත් කර, මේ සමඟ අමුණා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව, ඔවුන් විසින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් **<u>2023.08.18 දින හෝ ඊට පෙර applicationptr@gmail.com</u>** දරණ විද්‍යුත් ලිපිනය වෙත යොමු කර, එහි දෘඩ පිටපතක් **<u>2023.08.21 දිනට හෝ ඊට පෙර</u>** " ප්‍රධාන ලේකම්, ප්‍රධාන ලේකම් කාර්යාලය (බස්නාහිර පළාත් සභාව), අංක. 204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල යන ලිපිනයට SPEED POST/ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට කටයුතු කරන ලෙස ද දැනුවත් කරන්නේ නම් මැනවි.

06. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙලවරේ ඉල්ලුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතු ය. **<u>අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර</u>**, පත් කිරීම සම්බන්ධයෙන් අවසාන තීරණය බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් සතුවේ.

07. එසේම, යම් නිලධාරියෙකු උක්ත තනතුර සඳහා තෝරාගනු ලැබුව හොත් එම නිලධාරියා අදාළ පරිපාලන බලධාරියා වෙතින් බස්නාහිර පළාත් සභාව වෙත නිදහස් කරවා ගැනීමට බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම්ට මැදිහත් විය නොහැකි බවද සැලකුව මැනවි.

**ප්‍රදීප් යසරත්න**
**ප්‍රධාන ලේකම්**
**බස්නාහිර පළාත**

O/C
08/02

ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 1 ශ්‍රේණියේ තනතුරු සඳහා පත් කිරීමට අදාල ලකුණු පටිපාටිය
අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ (අධ්‍යාපන පරිපාලන)

| මාතෘකාව | උපරිම ලකුණු |
|---|---|
| ජ්‍යෙෂ්ඨත්වය<br>රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2019 අනුව ලකුණු ලබා දෙනු ලැබේ. | 50 |
| ක්ෂේත්‍රයේ/ක්ෂේත්‍ර වල පළපුරුද්ද<br><br>01.අධ්‍යාපන සංවර්ධනය<br>අධ්‍යාපන සංවර්ධනය සඳහා සිදු කරන ලද ව්‍යාපෘති එකකට ලකුණු 02 බැගින් ව්‍යාපෘති 05ක් සඳහා උපරිම ලකුණු 10 (මෙම ව්‍යාපෘති විධිමත් අනුමැතියක් සහිතව නිලධාරියා සෘජු දායකත්වයක් දක්වා ඇති ව්‍යාපෘති විය යුතු අතරම ව්‍යාපෘති වාර්තාව සහ කාළ රාමුව ඇතුලත් විය යුතුය.)<br><br>02. අධ්‍යාපන පරිපාලනය<br>I. අධ්‍යාපන පරිපාලන සේවයට පත්වීමෙන් අනතුරුව විදුහල්පති/නියෝජ්‍ය විදුහල්පති වරයෙකු වශයෙන් අවම වසර 01ක් සහිතව උපරිම වසර 02 ක් සඳහා ලකුණු 02<br><br>II. අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ, කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ වරයෙකු වශයෙන් අවම වසර 01ක සේවා කාලයක් සහිතව උපරිම - ලකුණු 08<br><br>• අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වසර 1 ක් සඳහා - ලකුණු 02 බැගින්<br><br>• නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ<br>කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ<br>වසර 1 ක් සඳහා } - ලකුණු 01 බැගින් | 20 |

| | |
|---|---|
| **වෘත්තීය සුදුසුකම් / පර්යේෂණ නවෝත්පාදන**<br><br>**(1) අධ්‍යාපන ක්ෂේත්‍රය පිළිබඳ පශ්චාත් උපාධි සුදුසුකම්**<br>(අදාළ සේවා ව්‍යවස්ථාවේ/ බඳවා ගැනීම් පටිපාටියෙහි විශේෂයෙන් දක්වා ඇති ක්ෂේත්‍ර/ විෂයයන් අතරින් අදාළ ක්ෂේත්‍රය තෝරන්න)<br><br>a) පර්යේෂණයක් සහිත පශ්චාත් උපාධිය - ලකුණු 7<br>b) පශ්චාත් උපාධිය (පර්යේෂණ රහිත) - ලකුණු 6<br>c) පශ්චාත් උපාධි ඩිප්ලෝමා - ලකුණු 4<br>d) උපාධි/ පශ්චාත් උපාධි සහතික - ලකුණු 2<br><br>**(2) පර්යේෂණ හා නවෝත්පාදන (වෛකල්පික - අදාළ නම් පමණක් ඇතුලත් කරන්න)**<br><br>a) අදාළ ක්ෂේත්‍රය තුළ පේටන්ට් බලපත්‍ර / ප්‍රකාශන හිමිකම් සහිත නවෝත්පාදන/ නවීකරණ - **ලකුණු 10**<br>b) ජාත්‍යන්තර වශයෙන් පිළිගත් අධ්‍යාපනික සඟරාවක පළ වූ අදාළ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ලියවුණු පර්යේෂණ නිබන්ධන - **ලකුණු 6**<br>c) පිළිගත් අධ්‍යාපනික සඟරාවක පළවූ අදාළ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ලියැවුනු පර්යේෂණ නිබන්ධන - **ලකුණු 05**<br>d) වැඩ වපසරිය තුළ සාර්ථකව ක්‍රියාත්මක කරන ලද නව්‍යකරණ / තොරතුරු තාක්ෂණික සැකසුම් සංවර්ධනය - **ලකුණු 04** (ලේඛන සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි)<br><br>**(3) අධ්‍යාපන පරිපාලන ක්ෂේත්‍රය තුළ පුහුණුව**<br><br>(උක්ත පුහුණුව අධ්‍යාපන කළමණාකරණය පිළිබඳ විෂයානුබද්ධ පුහුණුවක් විය යුතුය,අදාල නිලධාරියාගේ පත්වීම හා රාජකාරියට අදාල විය යුතුය,එම පුහුණුව පළාත් හෝ ජාතික මට්ටමේ රජය විසින් පිළිගත් ආයතනයකින් ලබා තිබිය යුතුය.)<br><br>a) මාස 3ක හෝ ඊට වැඩි කාලයක - ලකුණු 1<br>b) දින 10ක හෝ ඊට වැඩි කාලයක - ලකුණු 0.5<br>c) දින 03ක හෝ ඊට වැඩි කාලයක - ලකුණු 0.2<br><br>**(4) ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව**<br>a) පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ රජයේ පුහුණු ආයතනයකින් ලබා ගත් ඉංග්‍රීසි භාෂා ඩිප්ලෝමාවක් / ලකුණු 6.5 ක හෝ ඊට වැඩි සමස්ථ කාර්ය සාධනයක් සහිත IELTS සාමාර්ථය / 2013 හෝ ඊට වැඩි TOEFL-CBT හෝ TOEFL-PBT හෝ ඊට වැඩි **ලකුණු 02** | 10 |

| | |
|---|---|
| b) පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ රජයේ පුහුණු ආයතනයකින් ලබා ගත් ඉංග්‍රීසි භාෂා සහතික පත්‍රය -ලකුණු 01<br><br>❖ ඉහළම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. | |
| **ප්‍රබලතා/ශක්තීන්**<br><br>**කාර්යය සාධන වාර්තා ආසන්න වසර 05 (උපරිම ලකුණු 05)**<br><br>a)කාර්යය සාධන ඇගයුම සතුටුදායක - ලකුණු ½ බැගින්<br><br>b)කාර්යය සාධන ඇගයුම සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහල හෝ ඊට වැඩි ලකුණු 01 බැගින්<br><br>**තොරතුරු තාක්ෂණ සහතික පත්‍ර පාඨමාලා (උපරිම ලකුණු 03)**<br><br>(එම පුහුණුව පළාත් හෝ ජාතික මට්ටමේ රජය විසින් පිළිගත් ආයතනයකින් හදාරා තිබිය යුතුය )<br><br>a) මාස 03-06 අතර පාඨමාලා - ලකුණු 02<br>b) මාස 06ට වැඩි අතර පාඨමාලා - ලකුණු 03<br><br>**අයදුම්කරු සම්මුඛ පරීක්ෂණයේ දක්වන කුසලතාවය (උපරිම ලකුණු 02)** | 10 |
| <u>**චර්යාත්මක නිපුණතා**</u><br><br>අයදුම්කරු විසින් දැනට සේවය කරනු ලබන සේවා ස්ථානයට අදාලව ආයතනයේ අරමුණු සාක්ෂාත් කිරීමට බලාපොරොත්තුවන සංවර්ධන වැඩපිළිවෙල ඉදිරිපත් කිරීමට දෘඪ පිටපතක් ඉදිරිපත් කල යුතු අතර ,තම ප්‍රායෝගික අත්දැකීම් ද ඇසුරු කර ගනිමින් විනාඩි 05ක වාචික ඉදිරිපත් කිරීමක් Power point presentation ඇසුරෙන් සිදු කළ යුතුය.ඒ සඳහා පහත සඳහන් කරුණු යටතේ ලකුණු ලබා දෙනු ලැබේ.<br><br>I. කාල කළමණාකරණය - ලකුණු 2 ½<br>II. සන්නිවේදන කුසලතාවය - ලකුණු 2 ½<br>III. අන්තර්ගතය (අයතනයේ අරමුණු,යෝජනා) - ලකුණු 2 ½<br>IV. සමස්ථ ඉදිරිපත් කිරීම - ලකුණු 2 ½ | 10 |

සටහන 1- ඉහත ලකුණු පටිපාටියේ "පිළිගත් විශ්ව විද්‍යාලයක්" ලෙස දක්වා ඇත්තේ ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලැබ ඇති විශ්ව විද්‍යාලයකි.

සටහන 2 - ඉහත ලකුණු දීමේ පටිපාටියේ සඳහන් කර ඇති සියළු පශ්චාත් උපාධි සුදුසුකම් ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලැබූ විශ්ව විද්‍යාලයකින් ලබාගත් ඒවා විය යුතු අතර උපාධි ප්‍රදානය කරන වෙනත් ආයතන වලින් ලබාගත් එවැනි සුදුසුකම් වේ නම් ඉහත කොමිෂන් සභාවේ පිළිගැනීම ලද ඒවා විය යුතුය.

දිනය: ........................................

කාර්යාල ප්‍රයෝජනය සඳහා

## ආදර්ශ අයදුම් පත්‍රය

### බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ
### අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ (අධ්‍යාපන පරිපාලන) තනතුර සඳහා අයදුම් කිරීම.

01. මුලකුරු සමග නම -

02. සම්පූර්ණ නම -

03. උපන්දිනය -

04. හැඳුනුම්පත් අංකය -

05. පෞද්ගලික ලිපිනය -

06. දුරකථන අංකය -

07. රාජකාරී ලිපිනය -

08. ඊ මේල් ලිපිනය -

09. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට පත්වූ දිනය -

10. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට පත්වූ පදනම -

(සාමාන්‍ය සේවක සංඛ්‍යා පදනමද/ විශේෂ සේවක සංඛ්‍යා පදනමද)

11. ශ්‍රී ලං.අ.ප.සේ.II ශ්‍රේණියට උසස් වූ දිනය -

12. ශ්‍රී ලං.අ.ප.සේ.I ශ්‍රේණියට උසස් වූ දිනය -

13. පූර්වාසන්න වසර 05 තුල සියළු වැටුප් වර්ධක උපයාගෙන ඇත/නැත -

14. පූර්වාසන්න වසර 05 තුල කාර්යසාධනය -

(ආයතන ප්‍රධානියා විසින් සහතික කල කාර්යය සාධන වාර්තා වල පිටපත් අමුණා එවිය යුතුය.)

| වසර | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| | | | | |

15. පූර්වාසන්න වසර 5 තුල වැටුප් රහිත නිවාඩු ලබා ගෙන ඇත/නැත -

අ. වැටුප් රහිත නිවාඩු ලබා ගෙන ඇත්නම් ඒ පිළිබඳව විස්තර -

16. (i) වර්තමාන සේවා ස්ථානය -

(ii) දරන තනතුර -

(iii) එම තනතුරට පත්වූ දිනය -

ඉහත සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

දිනය -

.............................................

අයදුම්කරුගේ අත්සන

**<u>ආයතන ප්‍රධානියාගේ සහතිකය -</u>**

.............................................................................................. මහතා / මහත්මිය / මෙනවිය සම්බන්ධයෙන් විනය පරීක්ෂණයක් පැවැත්වෙන බව / නොපැවැත්වෙන බව දන්වන අතර, ඔහු / ඇය විසින් සඳහන් කර ඇති තොරතුරු පෞද්ගලික ලිපි ගොනුව අනුව නිවැරදි බව සහතික කරමි. මෙම නිලධාරියා ඉල්ලුම් කර ඇති තනතුර සඳහා තෝරාගනු ලැබුව හොත් දැනට සිටින සේවා ස්ථානයෙන් අනුප්‍රාප්තිකයෙකු සහිතව / රහිතව මුදාහැරීමට එකඟ වෙමි / නොවෙමි.

..................................................

දිනය - අත්සන

නිල මුද්‍රාව

**<u>දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය -</u>**

ආයතන ප්‍රධානියාගේ නිර්දේශයට එකඟ වෙමි / නොවෙමි.

..................................................

දිනය - අත්සන

නිල මුද්‍රාව

**<u>අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය</u>**

ආයතන ප්‍රධානියාගේ / දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශයට එකඟ වෙමි / නොවෙමි.

..................................................

දිනය - අත්සන

නිල මුද්‍රාව